සම අයිතිය ව්‍යාපාරය
சம உரிமை இயக்கம்
Movement for Equal Rights
22/1, Melder Place, Nugegoda, Sri Lanka

2025-11-25

අමාත්‍යතුමා,
බුද්ධ ශාසන , ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
කොළඹ

**පුරාවිද්‍යා සංරක්ෂණය සඳහා  උපදේශන කමිටුවක් පත් කිරීම සම්බන්ධවයි .**

ඔබ අමාත්‍යාංශය විසින් ඔබගේ අත්සනින් යුතුව 2025 නොවැම්බර් මස 01 දින නිකුත් කර ඇති අංක 2460/56 දරන අති විශේෂ ගැසට් පත්‍රයක් මගින් ඒ සඳහා උපදේශන කමිටුවක් පත්කර තිබූ අතර 'සම අයිතිය ව්‍යාපාරය' ලෙස ඊට  අපගේ බලවත් විරෝධය පල කරන ලදී. අප ඇතුළුව මේ සම්බන්ධයෙන් සමාජයේ සංවේදී පිරිස් විසින් ඉදිරිපත් කර තිබූ විවේචන හමුවේ එම උපදේශන කමිටුව පත් කළ ඉහත ගැසට් නිවේදනය අවලංගු කිරීමට රජය තීරණය කර ඇති බව පසුව වාර්තා විය. නමුත් මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු කෙරෙහි තවදුරටත් අවධානය යොමු කරන ලෙස 'සම අයිතිය ව්‍යාපාරය' ලෙස ඔබගෙන් සහ ඔබ අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටිමු.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ එහි අධ්‍යක්ෂ ජෙනරාල්වරයා ගේ පූර්ණ වගකීම වන්නේ මෙරට පුරාවිද්‍යා වැදගත්කමකින් යුතු ස්ථාන හඳුනාගැනීම ගවේෂණය සහ සංරක්ෂණය යයි. ඊට විශේෂඥ දැනුමක් සහිත කාර්ය මණ්ඩලයක් ද එම දෙපාර්තමේන්තුව සතුව පවතී. එහි අඩුපාඩු තිබේ නම් ඒ සඳහා සුදුසුකම් සහිත ස්ථිර කාර්ය මණ්ඩල බඳවා ගැනීම ඇතුළු එම අඩුපාඩු නිවැරදි කිරීමද ඔබ ඇතුළු අමාත්‍යාංශය සහ රජයේ වගකීම වේ.  එසේ නොකර එම දෙපාර්තමේන්තුවට සහ එහි අධ්‍යක්ෂ ජෙනරාල්වරයාට උපදේශන සැපයීම සඳහා තාවකාලික පදනමින් උපදේශන කමිටුවක් පත් කිරීමේ අවශ්‍යතාව හා එහි කාර්යභාරය පිළිබඳව ප්‍රථම කොටම ප්‍රශ්න කළ යුතුව තිබේ. ඒ පිළිබඳව විධිමත් පැහැදිලි කිරීමක් කරන ලෙස අපි ඔබගෙන් ඉල්ලා සිටිමු.

අප කවුරුත් දන්නා පරිදි ලංකාව භාෂා විවිධත්වයකින් සහ ආගමික හා සංස්කෘතික විවිධත්වයකින් යුතුව සහ ඒ සඳහා විශාල ඉතිහාසයකට හිමිකම් කියන ජනතාවක් ජීවත්වෙන බහු ජාතික හා බහු ආගමික රටක් වේ. එපමණක් නොව ජාතිවාදී පදනමින් සහ ආගම්වාදී පදනමින් එම ජන කොටස් අතර ගැටුම් නිරන්තරයෙන් නිර්මාණය කරමින් විවිධ දේශපාලන වාසි සඳහා මෙන්ම රාජ්‍ය පාලනය සඳහා ඒවා යොදාගත් දේශපාලන ඉතිහාසයක් පවතින රාජ්‍යයක් වන අතර අදටත් ලංකාවේ ජාතික ගැටළුවට ස්ථිරසාර දේශපාලන විසඳුමක් ලබාදීමට අසමත් වූ රාජ්‍යයක් ද වේ. එවැනි පසුබිමක පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට පැවරී ඇති වෘත්තිමය වගකීම ඉටුකිරීම සඳහාත්, සියලු ජාතික ජනකොටස් සහ

ආගමික හා සංස්කෘතික ජන කොටස්වල විශ්වාසය සහ පිළිගැනීම එම දෙපාර්තමේන්තුවට හිමිවීම සඳහාත් එම දෙපාර්තමේන්තුව බුද්ධ ශාසන අමාත්‍යාංශයෙන් හෝ වෙනත් ආගමික අමාත්‍යාංශයකින් වෙන්වූ ස්වාධීන ආයතනයක් ලෙස කටයුතු කළ යුතුව තිබේ. නමුත් ඉතිහාසය පුරාම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව බුද්ධ ශාසන අමාත්‍යාංශය යටතේ පැවතීම නිසා එම දෙපාර්තමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් අන් ආගමික සහ ජනගහණයෙන් සුළුතර ජන කොටස් අතර අවිශ්වාසය හා සැකය වර්ධනය වී තිබේ.

ඔබ හා ඔබ අමාත්‍යාංශය උපදේශන සභාවක් පත්කර හෝ පත් කිරීමට යන්නේ එවැනි පසුබිමක වන අතර ඒ සම්බන්ධයෙන් විවිධ ජාතික ජන කොටස් අතර දැනටමත් සැක සංකා මතුවෙමින් පවතී.සියලු ජාතික ජන කොටස් වලට සහ ඔවුන්ගේ පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු ආගමික හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කටයුතු කළ යුතුව තිබේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා මහජන අදහස් ලබා ගැනීමේ ක්‍රමවේදයක් නිරන්තරයෙන් පවත්වා ගත යුතුව තිබේ. නමුත් දේශපාලන හා ආගමික සංස්ථාවල බලපෑම් මත පුරාවිද්‍යා උරුමයන් සංරක්ෂණය කිරීමේ මුවාවෙන් ඒ සඳහා විෂයානුබද්ධ සාධක හා සාක්ෂි තහවුරු නොවූ ස්ථාන යොදා ගනිමින් සංස්කෘතික හා ආගමික ආක්‍රමණයන් සිදු කිරීමත්, ජාතිවාදී හා ආගම්වාදී අරමුණින් සැබෑ පුරාවිද්‍යා වටිනාකමකින් යුතු උරුමයන් විනාශ කිරීමත් වැනි සිදුවීම් ඕනෑ තරම් ඉතිහාස තුළ දැකිය හැකිය. එවැනි පසුබිමක එක් ජාතික ජන කොටසකට සහ එක් ආගමකට වැඩි නැම්යාව කින් යුතු උපදේශන කමිටු පත් කිරීම හෝ එසේ පත්කර ඇති බවට හැඟී යන ලෙස සිදු කිරීම බරපතළ වරදක් වේ.

මතු වී ඇති ගැටලු විසඳා ගැනීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව බුද්ධ ශාසන අමාත්‍යාංශයෙන් බැහැරව ස්වාධීන ආයතනයක් ලෙස පිහිටුවීම සහ එහි කටයුතු විනිවිදභාවයකින් යුතුව පවත්වා ගැනීම සඳහා එම දෙපාර්තමේන්තුව විසින් මහජන අදහස් සහ පැමිණිලි ලබා ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතු බව 'සම අයිතිය ව්‍යාපාරය' යෝජනා කරයි. නමුත් අප යෝජනා කරන ක්‍රමවේදයෙන් බැහැරව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා රජය විසින් උපදේශන කමිටුවක් පත් කරන්නේ නම් සියලු ජාතික ජන කොටස් හා ආගමික සංස්කෘතික ජන කොටස් නියෝජනය වන පරිදි, ජාතිවාදී හා ආගම්වාදී ආන්තික අදහස් නොදරන සහ ඉතිහාසය තුළ එවැනි දේශපාලන භාවිතය ක නිරත නොවූ සහ විශේෂයෙන් ම ඒසඳහා ප්‍රාමාණික බුද්ධිමතුන්ගෙන් සැදුම්ලත් උපදේශන කමිටුවක් පත් කරන ලෙස ඉල්ලා සිටිමු.

ඉන්ද්‍රානන්ද ද සිල්වා,
කැඳවුම්කරු
සම අයිතිය ව්‍යාපාරය.

**පිටපත්-** ජනමාධ්‍ය වෙත